**UNIVERSITY OF PERADENIYA**
**පේරාදෙණිය විශ්වවිද්‍යාලය**
**CENTER FOR DISTANCE & CONTINUING EDUCATION**
**දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන කේන්ද්‍රය**

**ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි (බාහිර) පරීක්ෂණය-2014**

**(2015 අගෝස්තු)**

**ඉතිහාසය VI (HG 6)**

**විසිවන සියවසේ ලෝක ඉතිහාසය**

කාලය පැය **තුන** (03) යි.

යටත් පිරිසෙයින් **එක්** කොටසකින් **එක්** ප්‍රශ්නය බැගින් තෝරා ගෙන ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

සුදුසු තන්හි ඔබේ පිළිතුරු දළ සිතියම් මඟින් පහදන්න.

නොපැහැදිලි අත්අකුරුවලට ලකුණු කපා හරිනු ලැබේ.

මෙම ප්‍රශ්න පත්‍රයෙහි අඩංගු මුළු ප්‍රශ්න සංඛ්‍යාව **දොළස** (12) කි.

## පළමු වන කොටස

1. විසිවන සියවසේ ලෝකය එකම ලෝක ක්‍රමයක් ලෙස හඳුනා ගැනීමට උපකාරී වන ප්‍රධාන ලක්ෂණ කවරේද?
2. පළමු වන ලෝක යුද්ධයට තුඩුදුන් සාධක විභාග කරන්න.
3. 1919 සිට 1945 දක්වා කාලය තුළ අන්තර්ජාතික කොමියුනිස්ට් ව්‍යාපාරයේ තත්ත්වය විචාරාත්මකව විභාග කරන්න.

## දෙවන කොටස

4. ''ලෝක බල සමතුලිතතාවයෙහි ඇති වූ අර්බුදය දෙවන ලෝක යුද්ධයට මඟ පෑදිය.'' මේ ප්‍රකාශය විමසන්න.
5. ඇමරිකාව ලෝක බලවතෙක් ලෙස නැගී ඒමට ඉවහල් වූ සාධක පරීක්ෂා කරන්න.
6. යටත්විජිතහරණය ලෝක දේශපාලනයේ විකාශනයට කෙසේ බලපෑවේද?

## තුන් වන කොටස

7. 1949 සිට චීන-සෝවියට් සබඳතාව විමර්ශනය කරන්න.

8. විසිවන සියවසේ දෙවන භාගයේ ඈතපෙරදිග බල සමතුලිතතාව පැහැදිලි කරන්න.

9. 1962 දක්වා සීතල යුද්ධයේ විකාශය සාකච්ඡා කරන්න.

## හතර වන කොටස

10. 1962-1976 කාලය තුළ නැගෙනහිර-බටහිර සංහිඳියාවේ ප්‍රධාන ලක්ෂණ කවරේද?

11. තුන් වන ලෝකයේ ආර්ථික ඌණ සංවර්ධනයේ ස්වභාවය පැහැදිලි කරන්න.

12. පහත දැක්වෙන මාතෘකා අතුරින් දෙකක් පිළිබඳව ඓතිහාසික සටහන් ලියන්න.

(අ) වී. අයි. ලෙනින්

(ආ) සුභසාධක රාජ්‍ය ක්‍රමයේ වර්ධනය

(ඇ) සාර්ක් සංවිධානය

(ඈ) ඉස්ලාමීය මූලධර්මවාදය